ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන ඒ 017 මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (රක්වාන- සූරියකන්ද) - 2022

---

ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන ඒ 017 මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (රක්වාන- සූරියකන්ද) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2019 ජනවාරි 01 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයකට අනුව ක්‍රියාත්මක වේ. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ තොරතුරු අනුව, මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රක්වාන ප්‍රදේශයේ කිලෝමීටර 130.6 න් ආරම්භ කර සබරගමු පළාතේ සූරියකන්ද ප්‍රදේශයේ කිලෝමීටර 112.6 න් අවසන් වන ශ්‍රී ලංකාවේ ඒ 017 මාර්ගයේ කිලෝමීටර 18ක් පුනරුත්ථාපනය කිරීම මෙහි අරමුණ වේ. ව්‍යාපෘතියේ සමස්ථ අරමුණ වනුයේ සම්බන්ධතාව සහ ප්‍රවිශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ පොදු සමාජ- ආර්ථික සංවර්ධනයට දායකවීම වේ. මාර්ගය දෙපස තද සහ මෘදු උරහිස් සහිත මංතීරු දෙකක අධිවේගී මාර්ගයක් (10.0m) ලෙස සැලසුම් කර තිබුණි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,947.2කට සමාන එ.ජ.ඩො මිලියන 50.54 වන අතර ඉන් රු.මිලියන 5,497.9කට සමාන එ.ජ.ඩො මිලියන 40ක් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල මගින් මුල්‍යානයට එකගවී තිබුණි. ණය ගිවිසුම 2019 ඔක්තෝබර් 30 දින අත්සන් කරන ලද අතර 2023 සැප්තැම්බර් 30 දින අවසන් වීමට නියමිත වේ. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු 2022 වසර අවසානයේදී ප්‍රමාදයකින් යුතුව ආරම්භ කර තිබුණි.

1.3 මතය

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2022** දෙසැම්බර් **31** දිනට ලබා දී ඇති මුදල වන රු. මිලියන **320.47**, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස පෙන්වීම වෙනුවට මෙහෙයුම් ක්‍රියාකාරකම් ලෙස දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් සහ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් එම වටිනාකමින් පිළිවෙලින් වැඩියෙන් සහ අඩුවෙන් සටහන් වී තිබුණි. | **320.47** | එකඟ වේ. **2023** වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඒ අනුව වර්ගීකරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව පෙන්විය යුතුය. |
| (ආ) | **A** සහ **B** පැකේජය යටතේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන රු. මිලියන | **10.4** | එකඟ වේ. **2023** වර්ෂයේදී | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ |

| | | |
|---|---|---|
| **85.40**ක් ලෙස පෙන්වීම වෙනුවට රු. මිලියන **95.80**ක් ලෙස පෙන්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා කෙරීගෙන යන වැඩ සහ ජංගම වගකීම් වැඩියෙන් සටහන් වී තිබුණි. | අධි ප්‍රතිපාදනය සඳහා ගැළපීම් සිදු කර ඇත. | ප්‍රමිතියට අනුගත විය යුතුය. |

## 2.2 නොපියවූ ශේෂයන්

| විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | නොපියවූ කාලසීමාව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 2021 වර්ෂයේ සිට ජංගම වගකීම් යටතේ පෙන්වා ඇති රු. මිලියන 31.90 ක ගෙවිය යුතු මුදල් 2022 දෙසැම්බර් 31 දක්වා ද පියවීමට කටයුතු කර නොතිබුණි. අග්‍රිම අරමුදල් නොමැති වීම එම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපානු ලබයි. | 31.90 | වසර 1 කට වැඩි | එකඟ වේ.<br>GOSL සංරචකය යටතේ ප්‍රමාණවත් අග්‍රිම ලැබී නොතිබුණි. | ගෙවිය යුතු මුදල් පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාද සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | | |
| සිවිල් වැඩ | ඉදි කිරීම් | 40 | 11 | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් වසර 04 කට පසු සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. තවද, ව්‍යාපෘති කාලසීමාව තුළ ව්‍යාපෘති කටයුතු සාක්ෂාත් කර ගැනීමට නොහැකි බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන කටයුතු තාවකාලිකව අත්හිටුවීම,<br>ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය,<br>ණය දෙන නියෝජිතායතනයෙන් එකඟතාවය ලබා ගැනීම ප්‍රමාද වීම. |

| | |
|---|---|
| කළමනාකරණයේ ප්‍රතිචාරය | එකඟ නොවේ.<br>ණය මුදල 2020.05.18 වන දින COVID-19 හදිසි ආධාර ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීමට රජය විසින් තීරණය කර තිබුණි. එබැවින්, ප්‍රසම්පාදන කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත. |

| | |
|---|---|
| | තවද, මෙම තත්ත්වය හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම සහ වෙනත් ආයතනවල අනුමැතිය වැනි අනෙකුත් කටයුතු මන්දගාමී ලෙස සිදු කෙරෙමින් පැවතුණි. |
| විගණකගේ නිර්දේශයය | ණය පහසුකම නියමිත කාල සීමාව තුළ ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

**3.2** කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| විගණනයට ලැබී ඇති තොරතුරුවලට අනුව, කොන්ත්‍රාත් පැකේජ 3ක් යටතේ කිලෝමීටර 18ක මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට ව්‍යාපෘතිය විසින් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත් පැකේජය (C) යටතේ වැඩ ආරම්භ කර නොතිබුණි. එය ව්‍යාපෘතියේ ඉදිකිරීම් පිරිවැය ඉක්මවා යාමට හේතු විය හැක. | එකඟ වේ.<br><br>ඉහත අයිතම 4.1 (අ) හි සඳහන් හේතු නිසා පැකේජය (C) ආරම්භ කිරීමේ දිනය ප්‍රමාද වූ අතර ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය 2022.12.27 වේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3** මානව සම්පත් කළමනාකරණ ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති හතක් සඳහා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර තිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා අනුමත සේවක සංඛ්‍යාව විගණනයේදී වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම තත්ත්වය ව්‍යාපෘතියේ ප්‍රගතියට අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br><br>මෙම ව්‍යාපෘතිය සඳහා වෙනම කාර්ය මණ්ඩලය ඉල්ලා ඇති අතර අනුමැතිය මේ දක්වා ලැබී නොමැත. | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා නිසි අනුමැතිය ලබා ගත යුතුය |

**3.4** ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධ ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| විගණනයට ලැබී ඇති තොරතුරුවලට අනුව, ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ඉඩම් කට්ටි 1515ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය මගින් ඉඩම් කට්ටි 789ක් සඳහා පමණක් 38(අ) වගන්තිය නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දක්වා 17 වැනි වගන්තිය යටතේ කිසිදු ඉඩම් කට්ටියක් සඳහා වන්දි තක්සේරු කර නොතිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ දුර්වල අධීක්ෂණය ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් බලපා ඇති අතර අනාගතයේදී ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට එය අහිතකර | එකඟ වේ.<br><br>රට තුළ COVID කාල සීමාව තුළ පැවති තත්ත්වය හේතුවෙන් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයක් පවතී. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතු අතර නියමිත කාලය තුළ වන්දි තක්සේරු කළ යුතුය. |

ලෙස බලපෑ හැකිය.

### 3.5 නිෂ්ක්‍රීය/ අක්‍රීය/ ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙළින් රු. මිලියන 325.17 ක් සහ රු. මිලියන 70 ක් විදේශ ණය සහ GOSL සංරචකය යටතේ ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය මගින් රජයේ ප්‍රතිපාදනවලින් සියයට 10 ක් නියෝජනය කරමින් රු. මිලියන 7.24 ක් පමණක් භාවිතා කර තිබූ අතර ව්‍යාපෘතියේ දුර්වල ප්‍රගතිය හේතුවෙන් සම්පූර්ණ විදේශ ණය ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | GOSL සංරචකය යටතේ ප්‍රමාණවත් පරිදි අග්‍රිම නොලැබුණි. එබැවින්, GOSL ප්‍රතිපාදනවලින් සියයට 10 ක් පමණක් භාවිතා කරන ලදී. | ව්‍යාපෘති අරමුදල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.6 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ගොඩනැගිල්ලේ පළමු මහලේ ව්‍යාපෘති කාර්යාල හතක් පවත්වාගෙන ගොස් තිබුණද මෙම ව්‍යාපෘති හත සඳහා සාධාරණ ලෙස ගොඩනැඟිලි කුලිය බෙදා නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා රු. 1,020,000 ක කුලියක් ගෙවා තිබුණි. | එකඟ වේ.<br><br>විවිධ විදේශ ආධාර ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක වේ. එබැවින්, එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් එක් එක් මාසය සඳහා අග්‍රිම සහ ප්‍රතිපාදන ලබා ගැනීමේ හැකියාව මත වියදම් දරනු ලබයි. | කුලිය සාධාරණ ලෙස බෙදීමට කටයුතු කළ යුතුය. |